# තායි යුනියන් ව්‍යාපාරික ආචාර ධර්ම සහ කම්කරු චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහය.

## අපේ සැපයුම්කරුවන් සමග හවුල්ව වැඩ කිරීම

### හැඳින්වීම

මෙතැන් සිට "තායි යුනියන්" වශයෙන් හඳුන්වනු ලබන, "තායි යුනියන් ගෲප් පබ්ලික් කම්පැණි ලිමිටඩ්" සහ එහි උප සමාගම්, පුද්ගලයන්ගේ ජගත් මානුෂික අයිතිවාසිකම්වලට ගරු කිරීමක් වශයෙන් සියලුම සේවකයන්ට ආරක්ෂාව ලබාදීමටත් එක හා සමානව සැලකීමටත් උත්සාහ කරයි.

වගකීමකින් යුතුව ප්‍රභවයන් තෝරා ගැනීමට සහාය වෙමින්, සේවක ආරක්ෂාව සහ නිදහස සුරක්ෂිත කිරීම සඳහා අපේ සැපයුම්කරුවෝ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරති. අපිද, අපේම සමාගමට මෙන්, එම සිද්ධාන්ත සහ මිනුම් ලකුණු අපගේ සැපයුම්කරුවන්ටද ආදේශ කරන්නෙමු. චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහය අදටත්, අනාගතයටත් අපේ සැපයුම්කරුවන්ගෙන් අප බලාපොරොත්තු වන දේ ඔවුනට දැනුම් දීම සඳහා අප භාවිත කරන ක්‍රමයයි.

අපගේ සියලු මෙහෙයුම්වලදී අවංකව සහ විවෘතව ව්‍යාපාර කටයුතු කිරීමට අප සතුව ඇති කැපවීමත්, ජගත් මානුෂික අයිතීන්ට සහ මූලික කම්කරු සිද්ධාන්තවලට ඇති ගරුත්වයත් තායි යුනියන්හි මෙම චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහයේ අන්තර්ගතව ඇත. මෙම "චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහය" වගකීමෙන් යුතු ප්‍රභවයන් පිලිබඳ අපගේ බලාපොරොත්තුත් ඒ සඳහා වන ප්‍රවේශයත් පිලිබඳ ආකෘතියක සැකිල්ල සලසා දෙයි. මෙම ප්‍රතිපත්තිවලට අත්තිවාරමක් සේ නිර්මාණය වන මූලික සිද්ධාන්ත යටතේ නිරන්තර දියුණුව කරා ගෙනයාමටත්, විනිවිද භාවයටත්, අඩුලුහුඬුකම්වලට පිළියම් යෙදීමටත් අපේ සැපයුම්කරුවෝද එකඟ විය යුතුයි.

අපගේ චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහය අවශ්‍යතාවන් විශ්ලේෂණය කරන අතර මූලික ප්‍රතිපත්තිවල සෑම කොටසක් සඳහාම මිනුම් ලකුණු සපයයි.

### මූලික ප්‍රතිපත්ති

තිරසාර වර්ධනයක් උදෙසා ඇති අපගේ කැපවීම ඉදිරිපත් කරනු වස්, තායි යුනියන් හරහා වගකිව හැකි ප්‍රභවයන් සඳහා අපි කර්මාන්ත ප්‍රමුඛ කොට ගත් මිනුම් ලකුණු සකස් කර ඇත්තෙමු. අපි මෙම තත්වයන් අපගේ ව්‍යාපාරයේ සෑම අංගයකටම කාවද්දා ඇත්තෙමු. එමෙන්ම, එවැනිම හැඩි දැඩි තිරසාර ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීම සඳහා අපගේ හවුල්කරුවන් ලෙස එකතුවන ලෙසට අපි අපගේ සැපයුම්කරුවන්ට ආරාධනා කරන්නෙමු. එක්සත් ජාතීන්ගේ ගෝලීය සංගතයේ සාමාජිකයන් වන අපි, විශ්වීය ප්‍රතිපත්ති දහයක් ක්‍රියාත්මක කිරීමට, අනාවරණය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට කැපවී ඇත්තෙමු.

අපගේ චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහයේ අඩිතාලම නිර්මාණය කරන මූලික ප්‍රතිපත්ති, අන්තර් ජාතික තත්ත්වයන්ට ස්ථාන ගත කර ඇති අතර අපගේ මෙහෙයුම් සියල්ලටම කාවද්දා ඇත.

**1.** ව්‍යාපාර කටයුතු කෙරෙනුයේ නීත්‍යානුකූලව සහ සාධු ගුණයෙන් යුතුවය.

**2.** වැඩ සිදුකෙරෙනුයේ නීතිමය අනුකූලතාවක් සහිතව, නිදහසේ එකඟ වී කොන්දේසි ලේඛණ ගත කළ පදනමක් මතය.

3. සෑම ශ්‍රමිකයකුටම ගෞරවයකින් සහ උදාර බවකින් යුතුව එක සමාන ලෙස සලකනු ලැබේ.

4. වැඩ සිදු කෙරෙනුයේ බලකිරීම් හෝ අනිවාර්ය ශ්‍රම දායකත්වයෙන් තොරව ස්වෙච්ඡා පදනමක් මතය.

5. සියලු ශ්‍රමිකයෝ සුදුසු වයස්වල සිටින්නෝ වෙති.

6. සියලු ශ්‍රමිකයෝ සාධාරණ වැටුප් ලබති.

7. වැඩෙහි නිරත වන කාලය සෑම ශ්‍රමිකයකුටම සාධාරණ වේ.

8. සෑම ශ්‍රමිකයකුටම වෘත්තීය සංගමයකට බැඳීමේ අයිතිය පාවිච්චි කිරීමටද, නීතියෙන් ඉඩ ඇති විටක කණ්ඩායමක් ලෙස ඉල්ලීම් ඉදිරිපත් කිරීමටද නිදහස ඇත.

9. වැඩ බිමෙහිදී ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සනාථ වී ඇත.

10. සාධාරණ ක්‍රියා පිළිවෙත් සඳහා ශ්‍රමිකයන්ට අවස්ථා ඇත.

11. ව්‍යාපාර කටයුතු සිදු කෙරෙනුයේ තිරසාර පැවැත්මක් වැළඳගත හැකි අයුරින් සහ පරිසරයට කෙරෙන බැලපෑම් අඩුවන අයුරින්ය.

12. දියුණුවත් අනුකූලතාවත් නිරීක්ෂණය කරනු ලැබේ.

තායි යුනියන් අවංකව සහ අන්‍යයන්ට ගෞරවයකින් යුතුව තම ව්‍යාපාර කටයුතු සිදු කිරීමට වෙහෙසෙයි. අපගේ මිනිසුන් මෙන්ම - අපගේ සන්නාම මෙන්ම - අපගේ කීර්තිය, අපට වටින්නාවූ ධනයකි. අපි අපගේ ශ්‍රමිකයන්ගෙනුත් අප සමග ව්‍යාපාර කටයුතු කරන්නන්ගෙනුත් හැසිරීම් පිලිබඳ ඉතා ඉහල තත්වයන් අපේක්ෂා කරන්නෙමු. අපගේ සැපයුම් කරුවකු බවට පත්වීමෙන් ඔබ පවසන්නේ ඔබ අපගේ මූලික ප්‍රතිපත්තිවලට එකඟ වන බවයි.

## අ) තායි යුනියන් සමග ව්‍යාපාරික කටයුතු සිදුකිරීම සඳහා වන අනිවාර්ය අවශ්‍යතා

තායි යුනියන් සමග ව්‍යාපාරික සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමටත් එය පවත්වාගෙන යාමටත් අපගේ සැපයුම්කරුවන්ට තිබිය යුතු අනිවාර්ය අවශ්‍යතාවන් අපි මෙම කොටසෙහි විස්තර කරමු.

තායි යුනියන් සමග වැඩ කරන හෝ තායි යුනියන් වෙනුවෙන් වැඩ කරන හෝ සියලුම සැපයුම්කරුවන් ඔවුන්ගේ සියලුම ක්‍රියාකාරකම් මෙම අනිවාර්ය අවශ්‍යතාවන්ට අනුගත වන බව තහවුරු කිරීම අපට අවශ්‍ය වේ.

### *1. ව්‍යාපාර කටයුතු කෙරෙනුයේ නීත්‍යානුකූලව සහ සාධු ගුණයෙන් යුතුවය.*

අල්ලස

ඕනෑම සහ සියලුම අකාරයේ අල්ලස, දූෂණය, බලෙන් ලබාගැනීම හෝ මුදල් වංචා කිරීම සඳහා තහනමක් ඇත. සැපයුම්කරුවන් සිදුකරන වෙළඳ කටයුතුවලදී අල්ලස වැලැක්වීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි සකසා ඇත.

බැඳියා ගැටුම්

සැපයුම්කරුවන් දැනුවත්ව තායි යුනියන් සමග ඇතිකරගන්නා ඕනෑම ව්‍යාපාර ගනුදෙනුවක් සඳහා ඇති බැඳියාවන් පිලිබඳ සියලුම ගැටුම්, අවශ්‍ය සුදුසු ක්‍රියා මාර්ග ගැනීම සඳහා තායි යුනියන් වෙත ප්‍රකාශ කර සිටිය යුතු වේ.

සැපයුම්කරුවකුගේ ව්‍යාපාර කටයුත්තකදී රජයේ නිලධාරියකු හෝ දේශපාලන පක්ෂයක නියෝජිතයකු හෝ තායි යුනියන්හි සේවකයකු හෝ තායි යුනියන් සමග සම්බන්ධතාවක් ඇති කර ගැනීමට කලින්, අයිතිය හෝ වාසිය පිලිබඳ බැඳියාවන් තායි යුනියන් වෙත ප්‍රකාශ කෙරෙයි.

තායි යුනියන් සමග ව්‍යාපාර කටයුතු ආරම්භ කළ පසු එවැනි සම්බන්ධතා ගොඩනැගේ නම් ඒ බව තායි යුනියන් වෙත දැන්විය යුතු වීම නිරන්තර අවශ්‍යතාවයකි.

ත්‍යාග, ආගන්තුක සත්කාර සහ සංග්‍රහකිරීම්

ස්වභාවයෙන් සාධාරණ වන ඕනෑම ව්‍යාපාරික සංග්‍රහයක් හෝ ආගන්තුක සත්කාරයක් හෝ තායි යුනියන් සමග කළයුත්තේ ව්‍යාපාරික සම්බන්ධතාවක් පවත්වා ගැනීම යන කරුණ මත පමණක් මිස තායි යුනියන් වෙතින් ඉදිරි ව්‍යාපාර කටයුතු ලබාගැනීම සඳහා කිසි ලෙසකින් හෝ අනුබල දීමක් වශයෙන් නොවේ. තායි යුනියන් සේවකයන් සහ සැපයුම්කරුවන් අතර ත්‍යාග හුවමාරු කරගැනීම් මගහැරිය යුතුය. සමාගම් අතර නිල වශයෙන් සිදුවන ත්‍යාග හුවමාරු සඳහා අවකාශ ඇති වුවද ඒවා විනිවිද පෙනෙන අයුරින් සිදුවියයුතු අතර නිසි ලෙස ලේඛණගත විය යුතුය.

තරඟකාරීත්වය සහ තරඟකරුවන් පිලිබඳ විස්තර

තායි යුනියන් සමග තරඟ කරන්නන්ගේ සියලු විස්තර නීත්‍යානුකූලව ලබාගන්නා අතර ඒවා පාවිච්චි කරනුයේ අදාළ සියලු සංගත විරෝධී නීති, වෙනත් නීති සහ රෙගුලාසිවලට අනුගතව සිදුකෙරෙන නීත්‍යානුකූල කටයුතු සඳහා පමණී. මහජන බලප්‍රදේශයක සටහන් නොවන්නාවූත් ඔවුනට රහස්‍යවූත් තායි යුනියන්හි තරඟකරුවන් පිලිබඳ කිසිම තොරතුරක් කිසිම අවස්ථාවක තායි යුනියන් වෙත හෙළි කිරීමට උත්සාහ නොකෙරෙයි.

මුල්‍ය වාර්තා, මුදල් විශුද්ධිකරණය සහ අභ්‍යන්තර වෙළඳාම්

සියලු ව්‍යාපාර සහ වෙළඳ ගනුදෙනු විනිවිද බවකින් යුතුව සිදුකෙරෙන අතර සැපයුම්කරුවන්ගේ පොත්පත්වල ඒවා නිවැරදිව වාර්තාගත වෙයි. මුදල් විශුද්ධිකරණය සඳහා සත්‍ය සහභාගිත්වයක් හෝ ප්‍රයත්න දැරීමක් හෝ නැත. අභ්‍යන්තර වෙළඳාමේ නිරතවීමට හෝ එවැන්නකට උදව් කිරීමකට තායි යුනියන් භාවිත කිරීමක් පිළිබඳව සැපයුම්කරුවකු සතුව රහස්‍ය තොරතුරු නැත.

දේපල සහ තොරතුරු ආරක්ෂා කර ගැනීම

තායි යුනියන්හි රහස්‍ය තොරතුරු, දැනුම් හැකියාව සහ බුද්ධිමය දේපල ගරු කෙරෙන අතර ඒවා ආරක්ෂා කෙරේ. තායි යුනියන් විසින් සපයන ලද සියලු තොරතුරු පාවිච්චි කෙරෙනුයේ සැලසුම්කළ කරුණ සඳහා පමණී. තායි යුනියන්හි පාරිභෝගිකයන් හෝ සේවකයන් වැනි පුද්ගලයන් පිලිබඳ ඕනෑම තොරතුරක් සහ සියලුම තොරතුරු ඔවුන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කරනු සඳහාත් පුද්ගලත්වයට අදාළ නීති සහ රෙගුලාසිවලට අනුගතවීම සඳහාත් ගෞරවාන්විතව පරිහරණය කෙරේ.

නිෂ්පාදන ප්‍රමිතිය සහ භාරදූර නවයකරණය

නිෂ්පාදන සහ සේවා බෙදාහරිනුයේ අදාළ ගිවිසුම් පත්‍රිකාවල සටහන්ව ඇති පිරිවිතර, ප්‍රමිතිය සහ ආරක්ෂාව පිලිබඳ නිර්ණායක සපුරාලීම සඳහාත්, එය පාවිච්චි කිරීමට අදහස් කරන ලද කාර්යයේ ආරක්ෂාවට අනුකූලවත්ය. පර්යේෂණ සහ සංවර්ධනය වගකිවහැකි අයුරින් සිදු කෙරෙන අතර සාමාන්‍යයෙන් පිළිගන්නා විද්‍යාත්මක, තාක්ෂණික සහ ආචාරධර්ම ප්‍රතිපත්ති මෙන්ම යහපත් සායනික ක්‍රියාකාරකම් මත රඳා පැවැත්වේ.

නීතිවලට අනුගතවීම

සියලුම නීති සහ රෙගුලාසි ඉටුකෙරෙනුයේ සැපයුම්කරු ව්‍යාපාර මෙහෙයවන වන රටට අනුකූල වනසේය. අදාළ අනිකුත් සියලුම අන්තර්ජාතික නීති සහ රෙගුලාසි අනුකූල වන්නේ ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ නීති සහ රෙගුලාසි සමගය. ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ නීති සහ රෙගුලාසිද ඇතුලත්ව සම්බාධ, අපනයන පාලන, සහ පොරොන්දු වැනි අදාළ අනිකුත් සියලුම අන්තර්ජාතික නීති සහ රෙගුලාසි දත්ත සුරක්ෂා , සංගති විරෝධී සහ තරඟකාරීත්ව නීතිවලට අනුකූලවේ.

ගැටලු වාර්තා කිරීම සහ ප්‍රතිහිංසාවෙන් තොරවීම

ඕනෑම අවශ්‍යතාවක් පිලිබඳ ගැටලු ඉදිරිපත් කිරීමට සේවකයන්ට පහසුකම් සලසා ඇති අතර එවැනි කරුණක් පිළිබඳව හඬ නගන සියලුම සේවකයන් ප්‍රතිහිංසාවෙන් ආරක්ෂා කෙරෙයි.

1. ව්‍යාපාර අවංකත්වය ගැන ඇති බලාපොරොත්තු විස්තර කරන අල්ලස, ත්‍යාග සහ ආගන්තුක සත්කාර පිලිබඳ පැහැදිලි, සාධනීය මාර්ගසූචක සහ ප්‍රතිපත්ති සකස් කර ඇත. බැඳියා ගැටුම් මගහැරීම පිණිස මාර්ගසූචක සහ ප්‍රතිපත්ති තරගකාරීත්වය පිලිබඳ නීතිවලට අනුකූල විය යුතුය.

2. ගැටලු යටපත් කරන්නාවූ පුහුණුව සහ අවදානම තක්සේරුකිරීමේ යාන්ත්‍රණයන් සකස් කර ඇත. ඊට අනුකූල නොවීම සම්බාධවලට සහ ප්‍රතිකාර කලයුතු ක්‍රියා පටිපාටින්ට යටත්ය.

3. සියලුම මූල්‍ය ගනුදෙනු නිසිපරිදි වාර්තාගත කිරීම සහතික වනසේත්, සිදුවිය හැකි මුදල් විශුද්ධිකරණයක් හඳුනාගැනීම සඳහාත් ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පවත්වාගෙන යයි. හෙළි නොකළ හෝ වාර්තාගත නොකළ ගිණුම්, අරමුදල් හෝ වත්කම් ආරම්භ කරන්නේ හෝ පවත්වාගෙන යන්නේ නැත.

4. දැනගැනීම සඳහා පමණක් පරිශීලනය කිරීමේ සීමා කළ අවසර සහිතව, ව්‍යාපාරවලට හෝ නිෂ්පාදනවලට සම්බන්ධ සියලුම රහස්‍ය තොරතුරු ආරක්ෂිතව ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණ පවත්වාගෙන යයි.

5. සැපයුම්කරුවන්ගෙන් හෝ සැපයුම් දාමයෙන් මතුවන නිෂ්පාදන හෝ ආරක්ෂණ ගැටලු තායි යූනියන් වෙත වහාම දැනුම්දීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි පවත්වාගෙන යයි.

6. අදාළ නීති සහ රෙගුලාසි සැපයුම්කරුවන්ට සහ සේවකයන්ට අනුකූලවන බව සහතික වීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි පවත්වාගෙන යයි.

7. ප්‍රතිහිංසාවට බඳුන් වීම පිලිබඳ බියකින් තොරව ඔවුන්ගේ ගැටලු ඉදිරිපත් කිරීම සඳහා සේවකයන්ට මාර්ගයක් ඇත.

## 2. වැඩ සිදුකෙරෙනුයේ නීතිමය අනුකූලතාවක් සහිතව, නිදහසේ එකඟ වී කොන්දේසි ලේඛණ ගත කළ පදනමක් මතය.

ස්ථිර, තාවකාලික සහ පිටතින් අනුගතකළ සේවකයන්ට ගරුකිරීම සඳහාත්, අවම වශයෙන් සේවා ගිවිසුම්, දේශීය, ජාතික කම්කරු සහ සමාජ ආරක්ෂණ නීති සහ රෙගුලාසි සහ සමූහ ගිවිසුම් යටතේ ඔවුන්ගේ අයිතීන් ආරක්ෂාවීම සඳහාත් ප්‍රතිපත්ති පිළියෙළ කර ඇත; පිළිපැද ඇත.

2.1 වැඩ කරන පැයගණන , අතිකාල පැය ගණන, වැටුප්, ප්‍රතිලාභ, නිවාඩු, විනය සහ දුක්ගැනවිලි පිලිබඳ ක්‍රියා පද්ධති වැනි සේව්‍ය සේවක සබඳතාවන්හි වැදගත් අංගයන්

- පාර්ශව දෙකම නිදහසේ එකඟ වී ඇත
- ලේඛනගත කර ඇත
- සේව්‍යයා සහ සේවකයා අත්සන් කර ඇත

2.2 නියමයන් සහ කොන්දේසි ශ්‍රමිකයා පැහැදිලිව වටහාගෙන ඇත්තේය. අවශ්‍ය නම්, ඔහුට හෝ ඇයට තේරුම් ගත හැකි භාෂාවකින්, වාචිකව විස්තර කර දී ඇත්තේය.

2.3 වැදගත් අංගයන්ගේ සිදුවන වෙනස්කම් සඳහා සේව්‍යයා සහ සේවකයා යන දෙදෙනාම ලිඛිතව එකඟ වී ඇත.

## 3. සෑම ශ්‍රමිකයකුටම ගෞරවයකින් සහ උදාර බවකින් යුතුව එක සමාන ලෙස සලකනු ලැබේ.

සෑම ශ්‍රමිකයකුටම ගෞරවයකින් සහ උදාර බවකින් යුතුව එක සමාන ලෙස සලකනු ලැබේ. කිසිම සේවකයකු ශාරීරික, ලිංගික, හෝ මානසික අපහරනයකට හෝ වාචික හිරිහැරයකට හෝ වෙනත් ආකාරයේ බියගැන්වීමකට හෝ දරුණු අමානුෂික සංග්‍රහයකට හෝ භාජනය නොවේ. රැකියාවේ නිරතව සිටියදී කුලියට ගැනීම, හානිපූරණ කිරීම, උසස් කිරීම, විනය, සේවය අවසන් කිරීම, විශ්‍රාම යාම යන කරුණුවලදී එකිනෙකාට වෙනස් ලෙස නොසැලකේ. කුලය, ජාතිය, ජනවර්ගත්වය, ආගම, වයස, අබාධිත බව, ලිංග භේදය, විවාහක අවිවාහක තත්වය, ලිංගික හැඩගැස්ම, වෘත්තීය සමිති සාමාජිකත්වය, දේශපාලන සම්බන්ධතා, සෞඛ්‍යය, ගැබ් ගැනීම යන කරුණු මත එකිනෙකාට වෙනස් ලෙස සැලකීම වලක්වා ඇත. විශේෂයෙන්, වෙනස්වී සැලකීමකට වඩාත් භාජනය විය හැකි සේවකයන්ගේ අයිතිවාසිකම් වෙත අවධානය යොමුව ඇත.

3.1 කුලය, ජාතිය, ජනවර්ගත්වය, ආගම, වයස, අබාධිත බව, ලිංග භේදය, විවාහක අවිවාහක තත්වය, ලිංගික හැඩගැස්ම, වෘත්තීය සමිති සාමාජිකත්වය, දේශපාලන සම්බන්ධතා, සෞඛ්‍යය, ගැබ් ගැනීම යන කරුණු මත එකිනෙකාට වෙනස් ලෙස සැලකීම තහනම් කෙරෙන ප්‍රතිපත්ති සහ සේවකයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කරන ක්‍රියා පටිපාටි සකස් කර ඇත.

3.2 ගැබ් ගැනීම පිලිබඳ පරීක්ෂණ හෝ සෞඛ්‍ය ආවරණය කිරීම් මත ඇතිවිය හැකි, එකිනෙකාට වෙනස් ලෙස සැලකීම් සඳහා, ඉඩ නොදෙයි.

3.3 තමන් කරන වැඩවලට අදාල දැනුම, හැකියාව සහ නිපුණත්වය වර්ධනය කරගැනීම සඳහා සම අවස්ථා සහිතව ශ්‍රමිකයන්ට අනුමැතිය ලැබේ.

## 4. වැඩ සිදු කෙරෙනුයේ බලකිරීම් හෝ අනිවාර්ය ශ්‍රම දායකත්වයෙන් තොරව ස්වෙච්ඡා පදනමක් මතය.

ගිවිසුමකට බැඳී සිටිනවිට හෝ ඇපයට බැඳී සිටිනවිට හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ බලෙන් වැඩ ගැනීම පිළිගත නොහැක. මානසික හෝ ශාරීරික බලහත්කාරකම වහල් භාවය සහ හොර මිනිස් ජාවාරම තහනම්ය.

4.1 ශ්‍රමිකයන්ට නිදහස් ලෙස සහ සමානාත්මතාවෙන් යුතුව සේවයට ඇතුලත්වීම සහතික කිරීම සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටි සහ පුහුණු කරන ලද කාර්ය මණ්ඩල ස්ථාන ගත කර ඇත. කිසිවිටෙක ඔවුන් සේවය හැර යාම වලක්වනු නොලැබේ.

4.2 ශ්‍රමිකයන් සැපයුම්කරුවන්ගේ ප්‍රදේශයට සිරකොට නොමැති අතර ඔවුන්ට එහා මෙහා ගමන් කිරීමේ නිදහස ඇත.

4.3 ශ්‍රමිකයන් ඔවුන්ගේ හැඳුනුම් පත් භාර දීම අනවශ්‍යය. නීතිමය වශයෙන් අවශ්‍යතාවක් ඇතිවී හැඳුනුම් පත් රඳවා ගැනීමට සිදුවුවහොත් ශ්‍රමිකයන්ට ඒවා ලබාගත හැකි බව සහතික කරනු වස් කටයුතු පිළියෙළ කොට ඇත. ඔවුන් වැඩපල හැරයාම වලක්වා නැති අතර සේවය නතර වූ වහාම හැඳුනුම් පත් ඔවුනට භාර දෙනු ලබයි.

4.4 ශ්‍රමිකයන්ට වැටහෙන භාෂාවකින් කතා කිරීමට සැපයුම්කරුවන් සහතික වෙයි.

4.5 සැපයුම්කරුවන් ශ්‍රමිකයන්ට මුදල් අත්තිකාරම් හෝ ණය ලබාදීමද, ණයගැතිවීම හරහා ශ්‍රමිකයන් මෙම සේව්‍යයාට බැඳ තබාගන්නා වෙනත් ක්‍රියාවන්ද, මගහරිනු ඇත. නැතහොත් අවම කරනු ඇත.

## 5. සියලු ශ්‍රමිකයෝ සුදුසු වයස්වල සිටින්නෝ වෙති.

අවුරුදු 15 ට අඩු හෝ එම රටෙහි කම්කරු නීතියෙහි සඳහන් වන අයුරින් වැඩ කිරීමට සුදුසු අවම වයසට අඩු කිසිම ළමයකු, සැපයුම්කරුවකුගේ ඍජු අධීක්ෂණය යටතේ වෙනත් කිසිම කටයුත්තක් කරවා ගැනීම සඳහා සේවයෙහි පිහිටවන්නේ හෝ සේවයේ නිරත වන්නේ නැත. අවුරුදු 18 ට අඩු ශ්‍රමිකයන් අවදානම් කලාපවල වැඩ නොකරන බවටද ඔවුන්ගේ වැඩ කාලය දිනකට පැය 8 කට වැඩි නොවන බවටද, සහ එම වැඩ කාලය පස්වරු 10 සහ පෙරවරු 6 අතර ලබා නොදීමටද සැපයුම්කරුවන් සහතික වනු ඇත.

5.1 සේවය සඳහා අවශ්‍ය අවම වයස සඳහන් කර, වයස තහවුරු කරගන්නා ක්‍රම සහිතව(හැඳුනුම් පත හෝ රජයෙන් නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍රය වැනි) සාධනීය ක්‍රියා පටිපාටි සමගින් සේවයෙහි පිහිටුවීමේ ප්‍රතිපත්ති සකස් කර ඇත.

5.2 සෑම විටම තරුණ ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව ගැන සලකා බැලෙන අතර ඒවා සුරක්ෂිත කෙරෙයි. මෙම සුරක්ෂිත බව උපද්‍රව සහිත වැඩ වැනි සමහර වැඩ වර්ගවල හෝ රාත්‍රි වැඩවල යෙදීම අවහිර කරනු ඇත. ඒ සඳහා විශේෂ අවධානයක් සක කැපවීමක් අවශ්‍යය.

## 6. සියලු ශ්‍රමිකයෝ සාධාරණ වැටුප් ලබති.

ශ්‍රමිකයෝ නීත්‍යානුකූලව කේවල් කිරීමේ ගිවිසුම් මගින් ස්ථාපිත කරන ලද්දාවුත් රටෙහි පවතින නීත්‍යානුකූල තත්වයන් සහ හානි පූර්ණ පැකේජ ඉක්මවන්නාවුත් වැටුප්, අතිකාල දීමනා, ප්‍රතිලාභ, වැටුප් සහිත නිවාඩු සහිත සම්පූර්ණ හානි පූර්ණ පැකේජයක් ලබත්.

6.1 සෑම කාල පරාසයකටම නිවැරදි වැටුප, ප්‍රතිලාභ, දිරි දීමනා / බෝනස් සහ අඩු කිරීම් ඇතුලු හානි පූර්ණයේ කොටස් පැහැදිලිව පෙන්නුම් කරන වැටුප් පත්‍රිකාවක් ශ්‍රමිකයන්ට ලැබෙයි. වැටුප් පත්‍රිකාව සෑම ශ්‍රමිකයකුටම වටහා ගත හැකි භාෂාවකින් පිළියෙල වෙයි.

6.2 වැටුප් නිසි වෙලාවට සම්පූර්ණයෙන් ගෙවනු ලබයි.

6.3 කරන වැඩ සඳහා කරන හානි පූර්ණය අවම වශයෙන් නීත්‍යානුකූල අවම තත්වයන්ට සරිලන සේ හෝ ක්ෂේත්‍රයේ පවතින සුදුසු තත්වයන්ට අනුව හෝ සිදුවෙයි.

6.4 නීත්‍යානුකූලව කේවල් කිරීමේ ගිවිසුම් මගින් ස්ථාපිත කරන ලද්දාවූ හානි පූර්ණ කොන්දේසි ක්‍රියාවට නැංවෙයි; පිලිපැදෙයි.

6.5 නීතියෙහි දක්වා ඇති පරිදි බදු, සමාජ රක්ෂණය වැනි සියලුම නෛතික අඩුකිරීම්, වැටුප් කාලය තුලදී ඒවා ලබා ගැනීම සඳහා ස්ථාපිත කර ඇති ගිණුම්වල සහ ආයතනවල තැන්පත් කෙරෙයි.

6.6 විධි නියෝග මත කෙරෙන අඩු කිරීම් හැර වැටුපෙන් කෙරෙන අනිකුත් සියලුම අඩුකිරීම් සිදු කෙරෙනුයේ ශ්‍රමිකයන්ගේ ලිඛිත කැමැත්ත ප්‍රකාශ කිරීමක් මත පමණකි.

## 7. වැඩෙහි නිරත වන කාලය සෑම ශ්‍රමිකයකුටම සාධාරණ වේ.

ශ්‍රමිකයන් ඔවුන් සේවයේ නියුතු රටෙහි පවතින කම්කරු නීතිය විසින් ඉඩ හැර ඇති නියමිත වැඩ කාලයටත් අතිකාලයටත් වැඩියෙන් වැඩ කල යුතු නැත. ශ්‍රමිකයන්ගේ සියලු අතිකාල වැඩ කෙරෙනුයේ ස්වෙච්චා පදනම මතය.

7.1 ශ්‍රමිකයාගේ කැමැත්ත පරිදි අතිකාල තීරණය කිරීම පිණිස, සාමාන්‍ය වැඩ කාලය සහ වැඩ අතිකාල පිළිබඳව අර්ථ දැක්වූ ක්‍රියා පටිපාටි සමගින්, පැහැදිලි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත.

7.2 දින හතක කාලයකට පසු එක දිගට පය 24 ක විවේකයක් ලබාගැනීමේ හිමිකමක් ශ්‍රමිකයන්ට ඇත. අඛණ්ඩව නිෂ්පාදනය හෝ සේවය ලබාදීමට සිදුවීමක් නිසා ශ්‍රමිකයන්ට විවේක දිනයක වැඩ කරන්නට සිදුවුවහොත් ඉන් පසු ඔවුන් වහාම එම කාලයට සමාන හානි පූර්ණ විවේක කාලයක් ලබා ගත යුතුය.

7.3 රැකියා ගිවිසුම තුලින් ගිවිසුම්ගත අතිකාලයකට ඉඩ ලබා දී ඇත්නම් ශ්‍රමිකයෝ විශේෂයෙන් ඊට එකඟ වෙති. සියලුම අතිකාල වැඩ සිදුවනුයේ ස්වෙච්චා පදනම මතය.

7.4 සියලු අතිකාල වැඩ සඳහා නීතියෙන් අර්ථ දක්වන ලද ගාස්තු ප්‍රමාණයන් මත ගෙවීම් සිදුකෙරේ.

## 8. සෑම ශ්‍රමිකයකුටම වෘත්තීය සංගමයකට බැඳීමේ අයිතිය පාවිච්චි කිරීමටද, නීතියෙන් ඉඩ ඇති විටක කණ්ඩායමක් ලෙස ඉල්ලීම් ඉදිරිපත් කිරීමටද නිදහස ඇත.

සංගම් ගතවීම සඳහාත් සාමූහික කේවල් කිරීම් සඳහාත් ශ්‍රමිකයන්ට ඇති අයිතිය හඳුනාගෙන ඇති අතර එයට ගරු කෙරෙයි. සංවිධාන ගතවීම සඳහා ශ්‍රමිකයන්ට ඇති අයිතිය භාවිත කිරීමේදී ඔවුනට හිරිහැර කිරීමක් හෝ තර්ජනය කිරීමක් සිදු නොවේ.

8.1 සංගම් ගතවීම සඳහා ශ්‍රමිකයන්ට ඇති අයිතියට ගරු කිරීමට කළමනාකරුවන්, පරීක්ෂකවරුන් සහ මුරකරුවන් පුහුණු කර ඇත.

8.2 ශ්‍රමිකයෝ ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන දැනුවත්ය. ඔවුන් ඒවා වටහාගෙන ඇත. ඒ අයිතිවාසිකම් අභ්‍යාස කිරීමට ඔවුන්ට විශ්වාසයක් ඇත. වෙනත් ශ්‍රමිකයකු හෝ කළමනාකරුවකු රුකියාවේ ඇති ඒ අයිතියට බාධා නොපමුනුවයි.

8.3 වැඩ වර්ජනය කිරීමේ අයිතිය ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ සංවිධානයේ අයිතියක් ලෙසත් සංවිධාන ගතවීමේ නිසග නිගමනයක් ලෙසත් හඳුනාගැනේ. මෙම අයිතිය අභ්‍යාස කිරීමට විරුද්ධව පලිගැනීමක් සිදු නොවේ.

## <u>**9.** වැඩ බිමෙහිදී ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සනාථ වී ඇත.</u>

වැඩ කරන අතරතුර සිදුවන, වැඩවලට සම්බන්ධවන හෝ ශ්‍රමිකයන්ගේ මෙහෙයුම් හේතු කොටගෙන ඇතිවන, තුවාල ලැබිය හැකි අනතුරු සිදුවීම වලක්වාලීම සඳහා සෞඛ්‍යය සම්පන්න සහ ආරක්ෂාකාරී වැඩබිමක් ලබාදී ඇත.

තමන්ගේ ගර්භණී බව පිළිබඳව සමාගමට දැනුම් දී ඇති ගැබිණී ශ්‍රමිකයන් අවදානම් සහිත වැඩ ක්ෂේත්‍රවල නොකරන බවට සැපයුම්කරුවෝ සහතික වෙති. ගැබිණී ශ්‍රමිකයන් දිනකට පැය 8 කට වඩා වැඩ නොකරන අතර රාත්‍රී 10 සිට උදෑසන 6 දක්වා ඇති රාත්‍රී වැඩ මුරයේද වැඩ නොකරයි. ගර්භණී බව හේතුකොටගෙන සැපයුම්කරුවන් ඔවුන්ගේ වැඩ නවතාලන්නේ හෝ තත්වය පහත හෙලන්නේ හෝ ප්‍රතිලාභ අඩු කරන්නේ හෝ නැත.

9.1 සැපයුම්කරුවෝ ශ්‍රමිකයන්ට, වැඩපොලෙහි සිටින වෙනත් අයට හෝ පරිසරයට අවදානමක් ලෙස පවතින උවදුරු නිරන්තරයෙන් හඳුනාගනිමින් එක්කෝ ඒවා ඉවත් කරති. නැතහොත් සීමා කරති.

9.2 වෘත්තීයට සම්බන්ධ සෞඛ්‍යය සහ ආරක්‍ෂාව පිලිබඳ පැහැදිලි සහ ක්‍රියාකාරී ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකසා ඇති අතර ඒවා නිතිපතා යාවත්කාලීන වෙමින් පවතී.

9.3 වෘත්තීයට සම්බන්ධ සෞඛ්‍යය සහ ආරක්‍ෂාව පිලිබඳ පැහැදිලි සහ ක්‍රියාකාරී ප්‍රතිපත්ති පුලුල් වශයෙන් සන්නිවේදනය කරන අතර ගිනි නිවුම් හරඹ ඇතුලු කාලානුරූප පුහුණුවද ලබාදී ඇත.

9.4 වැඩපලෙහි දිගු කලක් තිස්සේ පවතින අනතුරු පිළිබඳව ව්‍යාපාරික ස්ථානයට ඇතුල්වන සියලු ශ්‍රමිකයනුත් වෙනත් පුද්ගලයනුත් දැනුවත් කරන අතර එවැනි අනතුරු වලක්වා ගැනීමට ඔවුන් වෙත ප්‍රමාණවත් දැනුමක්ද පුද්ගලික ආරක්‍ෂිත උපකරණද ලබා දෙනු ලැබේ.

9.5 පරිශ්‍රයට ඇතුල්වන හෝ නිෂ්පාදන හා සම්බන්ධව ක්‍රියාකරන සියලු දෙනා, සෞඛ්‍යය සහ ආරක්‍ෂාව පිලිබඳ සිදුවන සිද්ධියකදී සුදුසු පරිදි ක්‍රියාත්මකවන අන්දම ගැන නියම ලෙස දැනුවත් කර ඇත.

9.6 සියලුම පුද්ගලයන්ට සේව්‍යයාගේ වියදමින් පුද්ගලික ආරක්ෂිත උපකරණ සපයනු ලබයි. ඔවුන්ගේ කටයුත්ත සපුරාලීම සඳහා සේවකයන්ට අවශ්‍ය පුහුණුව ලැබෙයි.

9.7 ආරක්‍ෂා සහගත සහ සෞඛ්‍යය සම්පන්නව වැඩකිරීම් සඳහාත්, තිබේ නම් ජීවත්වීම සඳහාත් අවශ්‍ය තත්වයන් සපයනු ලැබේ. අවම වශයෙන් බීමට යෝග්‍ය ජලය, ප්‍රමාණවත් සහ පිරිසිදු ගිමන් හල්, ප්‍රමාණවත් වාතාශ්‍රය, ගිනි දොරටු සහ අත්‍යාවශ්‍ය ආරක්ෂිත උපකරණ, හදිසි ආධාර කට්ටලයක්, හදිසි වෛද්‍ය පසුකම් සඳහා ඉඩකඩ, සනීපාරක්ෂාව සහිත භෝජන ශාලාවක් සහ සුදුසු පරිදි ආලෝකමත් කළ වැඩපොලත් සපයා දිය යුතු වේ.

## 10. සාධාරණ ක්‍රියා පිළිවෙත් සඳහා ශ්‍රමිකයන්ට අවස්ථා ඇත.

වෘත්තිමය සබඳතාවල කොටසක් ලෙස මතුවන ගැටලු වේගවත්, අපක්ෂපාතී සහ සාධාරණ ලෙස විසඳීම සඳහා විනිවිදබවින් යුත්, සාධාරණ සහ රහස්‍ය ක්‍රියා පටිපාටි ශ්‍රමිකයන්ට සපයා ඇත.

10.1 ක්‍රියා පටිපාටි (අ) චෝදනා කිරීමට, යෝජනා කිරීමට සහ මැසිවිලි ඉදිරිපත් කිරීමට පලදායීවූත්, ශ්‍රමිකයන්ට ලඟාවිය හැකිවූත්, නාලිකා සපයයි. (ආ) එවැනි දේ විමර්ශනය කර ප්‍රතිපලයක් ලෙස වේගවත්, අපක්ෂපාතී සහ සාධාරණ විසඳුම් ලබාදීමට අවශ්‍ය වෙයි.

10.2 දුක් ගැනවිලි ඉදිරිපත් කරන යාන්ත්‍රණය පිළිබඳව පුලුල් වශයෙන් සංනිවේදනය කර ඇත. එය ඕනෑම චෝදනාවක රහස්‍ය බව (අවශ්‍ය නම්) සඳහා වගකියන අතර බාධාකිරීම් තහනම් කරයි.

## 11. ව්‍යාපාර කටයුතු සිදු කෙරෙනුයේ තිරසාර පැවැත්මක් වැළඳගත හැකි අයුරින් සහ පරිසරයට කෙරෙන බැලපෑම් අඩුවන අයුරින්ය.

මෙහෙයුම්, ප්‍රභව තෝරා ගැනීම්, නිෂ්පාදනය කිරීම්, භාණ්ඩ බෙදා හැරීම් සහ සැපයුම් සේවා සිදුකෙරෙනුයේ පරිසරය පවත්වා ගෙන යාමත් ආරක්ෂා කිරීමත් ඉලක්ක කරගෙන පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුගත් වන පරිදිය.

11.1 මෙහෙයුම් සඳහා අවශ්‍ය සියලු නීත්‍යානුකූල අවසර ලබා ඇත.

11.2 නීත්‍යානුකූල අවසර වලට අනුගත වීමට අවශ්‍ය දැනුම සියලුම පුද්ගලයන්ට ලැබීම සහතික කරනු වස් පුහුණුව ලබා දෙයි.

11.3 නීත්‍යානුකූල අනුගතවීම කළමනාකරණය කිරීම සඳහා පමණක් නොව උපද්‍රව සහිත රසායනික ද්‍රව්‍ය, කසල, අපවිත්‍ර ජලය, වායු දූෂණය නිපදවීම, ජලය සහ ශක්තිය පාවිච්චිය සඳහාත් පලදායී පරිසර කළමනාකාරීත්ව සැලැස්මක් තිබිය යුතුයි.

## 12. දියුණුවත් අනුකූලතාවත් නිරීක්ෂණය කරනු ලැබේ.

චර්යා පිළිබඳ උපදෙස් සංග්‍රහයට අනුගත වීම තහවුරු කිරීම පිණිස නිෂ්පාදන පහසුකම් සහ සේවකයන්ට ලබාදුන් නිවාස පිළිබඳව වැඩබිමේ සිදුකෙරෙන අප්‍රකාශිත පරීක්ෂාකිරීම්, සේවා නියුක්ති කරුණු සම්බන්ධව පොත්පත් සහ වාර්තා විමර්ශනය කිරීම් සහ සේවකයන් සමග පවත්වන පුද්ගලික සම්මුඛ සාකච්ඡා ද ඇතුලු මන්තුකිරීමේ ක්‍රියාවන්හි නිරතවීමට සැපයුම්කරු තායි යුනියන්ට, උප සමාගම්වලට සහ පත්කරන ලද නියෝජිතවරුන්ට අවසරය දෙනු ඇත.

# (ආ) පලුදුකිරීම් පිලිබඳ වාර්තාකරණය

මෙම නියෝග තායි යුනියන් සමග ගිවිසගත් සියලුම සැපයුම්කරුවන්ට අදාල වේ. තායි යුනියන් වෙත භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම සිදුකළේ සමාගම් සහ උප සැපයුම්කරුවන් මගින් නම් සැපයුම්කරුවන් මෙම නියෝග උප සැපයුම්කරුවන්ට සහ ප්‍රභව ඉදිරිපත්කරන සමාගම් වලටද අදාල වන බව සහතික කරගත යුතුය.

1. මෙම ප්‍රතිපත්තිවලට අනුගතවීමට නොහැකිවුවහොත් (තායි යුනියන්හි සේවකයකුට හෝ තායි යුනියන් වෙනුවෙන් පෙනීසිටින කෙනෙකුට සිදුවන නොහැකිවීමක්ද ඇතුලුව) සහ ඒ බව සැපයුම්කරු දැනගතහොත් එය වහාම තායි යුනියන් වෙත වාර්තා කළ යුතු වේ. එසේ කිරීමට අපොහොසත් වීම මෙම චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහයේ එන කරුණු පලුදුකිරීමක් වන්නේය.

2. පලුදු කිරීමකට හෝ සිදුවියහැකි පලුදු කිරීමකට විරුද්ධව, බාධා කිරීමක් පිළිබඳ කිසිදු බියකින් තොරව, අපේම ශ්‍රමිකයන්, සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ ශ්‍රමිකයන් වෙනුවෙන් කතා කරන, සංස්කෘතියකට අපි සහාය පළකරමු.

3. වාර්තාවන එකඟ නොවීමක් ගැන යහපත් විශ්වාසයකින් යුතුව තායි යුනියන් විසින් පරීක්ෂණ පවත්වනු ඇත. එහි සොයාගැනීම් ගැන තායි යුනියන් සැපයුම්කරු සමග සාකච්චා කරනු ඇත. සාධාරණ ලෙස ඉල්ලුම් කරන තොරතුරු ලබාදෙමින් සැපයුම්කරු එවැනි පරීක්ෂණයකට සහාය දෙනු ඇත.

4. ප්‍රතිකර්මයක් අවශ්‍ය නම් සැපයුම්කරු තායි යුනියන් වෙත දැනුම් දෙනු ඇතැයිද සාධනීය ලෙසත් කඩිනම් ලෙසත් බිඳවැටීම විසඳීම පිණිස නිවැරදි කිරීමේ සැලැස්මක් සහ කාල නිර්ණයක් ක්‍රියාත්මක කරනු ඇතැයිද බලාපොරොත්තු වේ.

5.සැපයුම්කරුවන්, ඔවුන්ගේ ශ්‍රමිකයන් හෝ කොන්ත්‍රාත්කරුවන් මෙම චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහයේ පලුදුවීමක් හෝ පලුදු වියහැකි අවස්තාවක් ගැන ලිපියකින්, දුරකථනයෙන්, ෆැක්ස් මගින් හෝ විද්‍යුත් ලිපියක් මගින් තායි යුනියන් වෙත දන්වනු ඇත. නීතියෙන් අවසර ඇති විටෙක වාර්තා නිර්නාමිකව සහ රහසිගතව ඉදිරිපත් කළ හැක.

## පලුදුවීම් වාර්තා කළ හැකි නාලිකා මෙසේයි.

තාවීපෝර්න් චොම්චාන් මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරි, මානව සම්පත් කළමනාකාරිත්වය
ඊ-මේල්: taweeporn.chomchan@thaiunion.com

ලිපිනය: 72/1 Moo 7, Sethakit 1 Road, TambonTarsrai,
AmphurMuang, Samutsakorn 74000, Thailand

දුරකථනය : +66 (0) 3481-6500
ෆැක්ස් : +66 (0) 3481-6499

විශ්වසනීය ඊ-මේල් ලිපිනය : labor.CoC@thaiunion.com

ව්‍යාපෘතිය: ISSARA

විදේශීය ශ්‍රමිකයන්ට කම්කරු අයිතිවාසිකම්, රාජ්‍ය ලියාපදිංචිය, ක්‍රියා සන්තති පිලිබඳ තොරතුරු ලබාගැනීම සඳහා, කිසියම් සිදුවීමක් වාර්තාකිරීම සඳහා, සහාය පැතීම සඳහා දවසේ පැය 24 පුරා ක්‍රියාත්මකව පවතින තායිලන්තයේ දේශය පුරා විහිදුන කම්කරු ඍජු දුරකතන අංක:

මියන්මාර් භාෂාව : +66-80-456-5560

ලාඕ සහ තායි භාෂාව : +66-86-967-2891

ඛ්මෙර් භාෂාව : +66-86-968-6085

අන්තර් ජාලය : www.projectissara.org

6. මෙම චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහයට හෝ නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියා පිළිවෙලට හෝ අනුගත වීමට  අපොහොසත් වීම වගකීම් විරහිතව සැපයුම්කරුගේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත්, නීති කටයුතු කිරීමටත් හේතු පාදක වනු ඇත.

2015 සැප්තැම්බර් 18 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී.

| | |
|---|---|
| ............................................... | ............................................... |
| තිරපොන්ග් චන්සිරි | චෙන්ග් නිරුට්ටිනනොන් |
| සභාපති සහ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ | විධායක සභාපති |
| තායි යුනියන් සමූහය (පී සී එල්) | තායි යුනියන් සමූහය (පී සී එල්) |

2015 සැප්තැම්බර් 18 වැනි දින (පී සී එල්) ප්‍රකාශයට පත් කරන ලදී.

## එකඟවීම සහ භාරගැනීම

මම තායි යුනියන්හි ව්‍යාපාර ආචාර ධර්ම සහ කම්කරු චර්යා පිලිබඳ උපදෙස් සංග්‍රහය සම්පූර්ණයෙන්ම කියවා තේරුම් ගත් බව මෙයින් සහතික කර ප්‍රකාශ කර සිටිමි. මගේ සමාගමේ බලයලත් නියෝජිතයකු ලෙස, මම, මෙම උපදෙස් සංග්‍රහයට ගරු කිරීමටත් නොනැවතී සම්පූර්ණයෙන්ම ඊට සහ එහි ඇති සියලු ප්‍රතිපත්තිවලට අනුගත වීමටත්  මටත් මගේ සමාගමටත් කැපවෙමි.

සැපයුම්කරු: ......................................

ලිපිනය:...............................................................................

නියෝජිත:...........................................

අත්සන:.............................................

දිනය:..................................................